LOGS.LK



# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම - 2024

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරෙ හි පවත්නා පුරප්පාඩු **එකසිය හතලිස් අටක් (148)** සඳහා පත් කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලත් පශු වෛද්‍ය විද්‍යා උපාධිධාරින්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ''අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය'' යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුර" යනුවෙන් පැහැදිලි ව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2024.05.10** දින වේ.

***සටහන :*** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

   i. පශු වෛද්‍ය නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබාගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාපදිංචි දිනය අනුව අනුපිළිවෙලින්, කුසලතා ලේඛනයේ අවසානයට ඇතුළත් කරනු ඇත.

   ii. පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට එකසිය දහයක (110%) කට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, කුසලතා ලේඛනයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

   iii. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

   i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටතේ විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

   ii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පශු වෛද්‍ය නිලධාරී තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා පත් කරනු ලැබේ.

   iii. තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන්, 2020.10.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි සඳහන් විධිවිධාන අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ. ඔබගේ බඳවා ගැනීමේ මාධ්‍ය වනුයේ ඔබ විසින් උපාධිය සම්පූර්ණ කරන ලද මාධ්‍යය වේ. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු තනතුරෙ හි ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක III මට්ටමේ ප්‍රවීණතාවයක් ලබාගත යුතු වේ.

iv. සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි 2013.12.13 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන්වලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 47,615 - 10x1335-8x1630 - 17x2,170 - රු. 110,895 (SL-1-2016) වේ.

ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක්.

5. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

6. *කායික සුදුසුකම්* :

i. සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

ii. තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම්* :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම ඇතුළුව මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *සම්මුඛ පරීක්ෂණය* :

8.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

9. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

i. ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත ම ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශ අයදුම්පත අනුව සකස් කළ යුතු ය.

ii. සම්මුඛ පරීක්ෂණ සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

*a.* ජාතික හැඳුනුම්පත/ වලංගු ගුවන් ගමන් බලපත්‍රය;

*b.* උප්පැන්න සහතිකය;

*c.* උපාධිය හා අදාළ වෙනත් සහතික;

*d.* මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් සහ එය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතු ය.)

*e.* සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස් ම විභාගවල සහතික;

*f.* පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය.

10. *වෙනත් විධිවිධාන :*

i. මෙම *ගැසට් නිවේදනයේ* විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍යසේවා කොමිෂන් සභාව සතු වනු ඇත.

ii. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

iii. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතු ය.

iv. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.

v. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති යම්කිසි කරුණක් සාවද්‍ය බව දන දනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,<br>
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,

2024.04.01 වැනි දින

ත